**මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2017**

**--------------------------------------------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17 (2) නියමය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 49 (1) වගන්තිය ප්‍රකාර විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මේ සම්බන්ධයෙන් විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2018 මැයි 10 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම්**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේදී ජර්නල් සටහන් මගින් ගලපන ලද රු. 459,425 ක් වූ ප්‍රචාරන වියදම් සත්‍ය වශයෙන්ම විද්‍යායතනය සම්බන්ධයෙන් පැන නැඟුණු ඒවාද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට අදාළ මූලාශ්‍ර ලේඛන හා අනෙකුත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 381 (1) | රාජකාරි බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර අනුමැතිය ලබාගත යුතුව තිබුණද විද්‍යායතනයේ බැංකු ජංගම ගිණුම ආරම්භ කිරීම සඳහා එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 386 (4) | නිකුත් කරනු ලබන සෑම චෙක්පතකම වලංගු කාල සීමාව එය ලියූ දින සිට දින 30 කට සීමා කළ යුතු අතර ඒ බව චෙක්පතෙහි මතුපිට පැහැදිලිව සඳහන් කළ යුතුය.නමුත් විද්‍යායතනය විසින් ආරම්භයේ සිට භාවිතා කර තිබුණු චෙක්පත්වල වලංගු කාල සීමාව සඳහන් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 386 (6) | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව සියලුම චෙක්පත් රේඛණය කළ යුතු වුවත් ආරම්භයේ සිටම විද්‍යායතනය විසින් විවෘත චෙක්පත් භාවිතා කර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 751 | වටිනාකම රු.4,289,080 ක් වූ භාණ්ඩ හා උපකරණ අයිතම 118 ක් අදාළ අංශවල ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,356,875 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,223,799 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,580,674 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.2,338,317 කින් අඩුවුවද වෙනත් ආදායම් හා විලම්භිත ආදායම් ක්‍රමක්ෂය එකතුව රු.3,040,053 කින් වැඩිවීම හේතු කොටගෙන මෙහෙයුම් ආදායම් රු.701,736 ක වර්ධනයක් පෙන්නුම් කළද, සත්‍ය වියදම රු.9,282,410 කින් වැඩිවීම ඉහත පිරිහීමට හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 ක මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය කිරීමේදී 2015 වර්ෂයේදී ඌනතාවයක්ද, 2016 වර්ෂයේදී අතිරික්තයක්ද, 2017 වර්ෂයේදී නැවත ඌනතාවයක්ද ඇතිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු ආයතනයේ 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දායකත්වය වර්ධනය වී නැවත 2017 වර්ෂයේදී දායකත්වය අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රු.47,013,252 ක් වූ දායකත්වය සියයට 8 කින් අඩුවී සමාලෝචිත වර්ෂයේදී රු.43,423,410 ක් වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලසුමක් පිළියෙල කළ යුතු වුවද විද්‍යායතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආහාර තාක්ෂණ අංශයේ සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමට 2015 වර්ෂයේදී රු.6,903,573 ක් වටිනා තවත් උපකරණ 19 ක් ලැබී තිබුණද ඒවා ස්ථානගත කිරීම සඳහා පහසුකම් විද්‍යාගාරය තුළ නොතිබීම නිසා එම උපකරණ භාවිතයට ගැනීමකින් තොරව ගොඩගසා තිබුණි.

(ආ) 2018 මාර්තු 31 දින වන විටත් ස්වයංචලන තාක්ෂණ, විලේපනවේදය, ආහාර තාක්ෂණ, සත්කාර සේවා කළමනාකරණය හා ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණය යන ඩිප්ලෝමා පාඨමාලා 05 ක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පිළිගැනීමේ සහතිකය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම පාඨමාලා 05 හදාරන අවසන් වසරේ සිසුන් සංඛ්‍යාව 23 ක් වූ අතර එකී සිසුන් 2018 ජූලි මාසයේ ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි.

(ඇ) විද්‍යායතනයේ යටිතල පහසුකම් සංවර්ධනය, භූමිය විස්තීර්ණ කිරීම, ඉඩපහසුකම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන තිබුණද ඒවා ඉටුකර ගැනීමට නොහැකිවීම නිසා 2018 වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීම 2015 ආරම්භක වර්ෂයේ දී බඳවාගෙන තිබුණු ශිෂ්‍ය කණ්ඩායම පිටවී යන දිනය දක්වා කල් දැමීමට සිදු වී තිබුණි.

(ඈ) විද්‍යායතනය විසින් මෙහෙයවනු ලබන සෑම පාඨමාලාවක් සඳහාම සිසුන් 30 දෙනෙකු බැගින් ඇතුළත් කරගත හැකිව තිබුණද, පාඨමාලා 04 ක් සඳහා 2017 වර්ෂයේදී ඇතුළත් කරගෙන තිබුණේ සිසුන් 89 දෙනෙක් පමණක් විය. ඒ අතරින් විලේපනවේදය (Cosmotology) පාඨමාලාවට ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 10 දෙනෙකු පමණක් වූ අතර මෙම පාඨමාලා කෙරෙහි සිසුන් ආකර්ශනය කරගැනීම සඳහා ක්‍රමවේදයක් විද්‍යායතනය විසින් අනුගමනය කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ බඳවාගත් පළමු ශිෂ්‍ය කණ්ඩායමේ සිට 2017 වර්ෂයේ බඳවා ගෙන තිබුණු අවසාන ශිෂ්‍ය කණ්ඩායම දක්වා වූ සිසුන් 630 දෙනෙකුගෙන් 105 දෙනකු 2018 මාර්තු 31 දින වන විට පාඨමාලා හැර ගොස් තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය අවසන් වන විට විද්‍යායතනය තුළ අධ්‍යාපනය ලබමින් සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 525 ක් වූ අතර ඔවුන්ට දේශන ශාලා සහ වෙනත් පහසුකම් ප්‍රමාණවත් ව නොතිබීම හේතුවෙන් හෙක්ටයාර 0.6608 ක් වූ යාබඳ භූමිය විද්‍යායතනයට පවරා ගැනීමට කටයුතු කර තිබුණද, 2018 මැයි 30 දක්වාම එම කටයුතු අවසන් වී නොතිබුණි.

(ආ) විද්‍යායතනය පිහිටි හෙක්ටයාර 0.5854 ක්වූ භූමි ප්‍රමාණය සහ ගොඩනැඟිලි 2018 මැයි 08 දක්වා අමාත්‍යාංශය විසින් විද්‍යායතනය වෙත පවරා දී නොතිබුණු බැවින් ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට නොහැකිව තිබුණි. තවද මෙම භූමි ප්‍රමාණයට අදාළ අංක 688 හා 688/1 යන වරිපනම් අංක විද්‍යායතනය නමට සංශෝධනය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මාතර මහා නගර සභාව විසින් ආහාර කොමසාරිස් නමින් වරිපනම් බිල්පත් නිකුත් කර තිබුණි.

(ඇ) 2017 ඔක්තෝබර් 02 දින සිට කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන තිබුණු ප්‍රධාන විධායක නිලධාරිණියට ගෙවා තිබුණු මාසික පාරිශ්‍රමික දීමනාව වූ රු.100,000 ට අදාළ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්වලට විද්‍යායතනයේ දායකය වූ රු.15,000 ක මුදල අදාල නිලධාරිනියගේ ඉල්ලීම හා පාලන මණ්ඩලයේ තීරණයක් මත එම අරමුදල්වලට ප්‍රේෂණය නොකර උක්ත දීමනාවට එකතු කර විධායක නිලධාරිණියට ගෙවා තිබුණි. 2017 ඔක්තෝබර් සිට 2018 ජනවාරි දක්වා එසේ ගෙවා තිබුණු දායක මුදල් එකතුව රු.60,000 ක් වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වර්ග 08 කට අදාළ භාණ්ඩ අයිතම 19 ක අතිරික්තයක් සහ වර්ග 31 කට අදාළ භාණ්ඩ අයිතම 77 ක ඌනතාවයක් පැවතුනි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

------------------------------

බාහිර කථිකාචාර්යවරුන් විසින් න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන පැවැත්වීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාඨමාලා සැලසුම(Lesson plan) අනුව පාඨමාලා 09 ක් සඳහා 2017 වර්ෂය තුළදී න්‍යායාත්මක දේශන පැය 4,071 ක් සහ ප්‍රායෝගික දේශන පැය 2,090 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද වර්ෂය තුළදී ආවරණය කර තිබුණේ පිළිවෙලින් දේශන පැය 2,868 ක් සහ 844 ක් පමණි. ඒ අනුව න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන පැය පිළිවෙලින් 1,203 ක් හා 1,246 ක් එනම් සියයට 30 ක් හා සියයට 60 ක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) NVQ 6 පාඨමාලාවේ පළමු සමාසිකය සඳහා Quantity Surveying Practice මාතෘකාවට අදාලව පැවැත්විය යුතුව තිබුණු න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන පැය සංඛ්‍යාව පිළිවෙලින් 90 ක් සහ 10 ක් වුවද වර්ෂය තුළදී කිසිදු දේශනයක් පවත්වා නොතිබුණි.

(ඇ) NVQ 5 පාඨමාලාවේ දෙවන සමාසිකය හා NVQ 6 පාඨමාලාවේ පළමු සමාසිකය සඳහා Event Promotion and Public Relations සහ Planning work to be performed at work place යන මාතෘකා සඳහා පැවැත්විය යුතුව තිබුණු න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන පැය සංඛ්‍යාව පිළිවෙලින් 38 ක් හා 27 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු දේශනයක් පවත්වා නොතිබුණි.

(ඈ) NVQ 6 පාඨමාලාවේ පළමු සමාසිකය සඳහා Event Leadership and Communication මාතෘකාවට අදාලව පැවැත්විය යුතුව තිබුණු න්‍යායාත්මක දේශන පැය සංඛ්‍යාව 20 ක් වී තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු දේශනයක් පවත්වා නොතිබුණි.

(ඉ) ආයතනයේ බාහිර දේශකවරුන් ලෙස 11 දෙනෙකු පත්කර තිබුණු අතර ඔවුන්ගේ පත්වීම් ලිපි පමණක් පෞද්ගලික ලිපි ගොනුවෙහි ගොනුකර තිබුණද, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කරගත් සහතික කිසිවක් ඒ තුළ නොවීය. තවද 2017 මැයි 29 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබාදී තිබුණද එකී ලිපිවල පත්වීම අවසන් වන දිනයන් සඳහන් කර නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.727,120 ක් වූ යාන්ත්‍රික උපකරණ මිලදී ගැනීමක් වෙනුවෙන් එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවෙකු වෙත රු.94,842 ක් වූ එකතුකල අගය මත බදු මුදලද ඇතුලත්ව ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) ඉංග්‍රීසි භාෂා ඒකකය සඳහා රු.1,636,286 ක් වටිනා ස්වයං අධ්‍යයන පරිගණක මෘදුකාංග 06 ක් 2016 ජුනි 10 දින මිලදී ගෙන තිබුණු අතර එම මෘදුකාංග, පරිගණක යන්ත්‍ර 11 ක් තුළ ස්ථාපනය කර ඇති බව පාඨමාලා සමායෝජක විසින් ලිඛිතව දන්වා තිබුණද 2018 මාර්තු 27 දින සිදු කරන ලද විගණන පරීක්ෂණයේ දී එලෙස පරිගණක යන්ත්‍රවල මෘදුකාංගය ස්ථාපනය කර නොමැති බව නිරීක්ෂණය විය.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.18,931,596 ක් වූ යන්ත්‍ර හා උපකරණ අයිතම 09 ක් වර්ෂ 2 සිට වර්ෂ 4 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව සහ ඌන උපයෝජිතව පැවැතුණි. තවද සිසුන්ට නොමිලයේ බෙදාදීම සඳහා 2014 නොවැම්බර් 20 දින රේඛීය අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ටී ෂර්ට්ස් 810 න් 433 ක් 2018 අප්‍රේල් 30 දින වන විටත් නිකුත් නොකර ගබඩාවේ පැවතුනි.

(ආ) විද්‍යායතනයේ ආහාර තාක්ෂණ (Food Technology) හා ස්වයං චලන තාක්ෂණ (Automobile Technology) යන අංශවල සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහා 2014 සහ 2015 වර්ෂවල ලැබී තිබුණු රු.4,761,510 ක් වටිනා විවිධ උපකරණ භාවිතා කිරීමට ප්‍රමාණවත් විදුලි පහසුකම් නොමැති වීම නිසා 2018 මාර්තු 31වන විටත් එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි .

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

2015 වර්ෂයේ සිට කථිකාචාර්ය තනතුරු 08 ක් හා තාවකාලික ප්‍රදර්ශක තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුනු අතර, එම පුරප්පාඩු පිරවීමට 2018 මාර්තු 31 වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය තුලදී විද්‍යායතනයේ ලේඛකාධිකාරී ඇතුළු තනතුරු 05 ක පුරප්පාඩු පැවතුන නමුත්, එම පුරප්පාඩු පුරවා ගැනීමට 2018 මාර්තු 31 දක්වාම කටයුතු කර නොතිබුණි.

## 5. තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟා නොවීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව විද්‍යායතනය ලඟාකර ගත යුතු අරමුණු සහ ඉලක්ක හා එම ඉලක්ක කරා ලගා විය යුතු සංධිස්ථානද ඉලක්ක කරා ලගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව විද්‍යායතනයෙහි අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 6.2 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය විසින් විගණන කමිටුව පිහිටුවා නොතිබුණි.

## 6.3 අයවැය ලේඛනමය පාලනය

2017 වර්ෂය සඳහා විද්‍යායතනය විසින් පිළියෙල කර තිබුණු වාර්ෂික අයවැය ලේඛනය 2017 අගෝස්තු 29 දින නැවත සංශෝධනය කර තිබුණු අතර අයවැයගත හා තථ්‍ය වියදම් අතර සියයට 15 සිට සියයට 185 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ පාඨමාලා සඳහා බඳවා ගත් දෙවන ශිෂ්‍ය කණ්ඩායමේ සිට මුදල් අය කිරීමකින් තොරව පාඨමාලාවන් පවත්වාගෙන යනු ලබන අතර, පළමු ශිෂ්‍ය කණ්ඩායමෙන් අය කරගෙන රේඛීය අමාත්‍යාංශය වෙත යවා තිබුණු රු.1,227,000 ක් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග විද්‍යායතනයේ අංක UCMT/ADM/CEO/SS/2016/03 හා 2016 අප්‍රේල් 28 දිනැති ලිපියෙන් රේඛීය අමාත්‍යාංශය වෙත විමසීමක් කර තිබුණද, 2018 අප්‍රේල් 30 වන විටත් ඊට පිළිතුරු ලැබී නොතිබුණි.

(ආ) (i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2014 පෙබරවාරි 10 දිනැති අංක DMS/1670 දරන ලිපියේ උපදෙස් පරිදි එහි සඳහන් අනුපාත ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) අදියර 7 ට වඩා අඩු අදියරයන් සඳහා යොදාගත නොහැකි බව දන්වා තිබියදී අදියර 5 සහ 6 යන පාඨමාලා සඳහා එම අනුපාත යොදා ගනිමින් බාහිර දේශකවරුන් 25 දෙනෙකුට දේශන පැයකට රු.1,500 ක් බැගින් දේශන පැය 1640 ක් සහ ප්‍රායෝගික පැයකට රු.750 ක් බැගින් ප්‍රායෝගික දේශන පැය 859 ක් සඳහා 2016 වර්ෂයේදී එකතුව රු.3,105,188 ක් ගෙවා තිබුණි.

(ii) එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී දේශන පැය 2668 ක් හා ප්‍රායෝගික පැය 844 ක් සඳහා ඉහත ලිපියේ සඳහන් උපදෙස්වලට අනුකූල නොවන පරිදි දේශන පැයකට රු.1500 ක් හා ප්‍රායෝගික පැයකට රු.600 ක් බැගින් එකතුව රු.2,630,524 ක් ගෙවා තිබුණු අතර ඉදිරිපත් කරන ලද එහෙත් නොගෙවූ වවුචර් වෙනුවෙන් රු.684,105 ක් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද උපචිත දේශන ගාස්තු සඳහා වෙන්කිරීමක් ලෙස රු.1,793,100 ක උපකල්පිත වටිනාකමක් ගිණුම්ගත කර තිබුණි.

## 6.5 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

විද්‍යායතනය තුළට ආහාර රැගෙන ඒමේදී ප්ලාස්ටික්, පොලිතීන් බෑග් සහ කෑම දවටන කොළ වෙනුවට වෙනත් ඇසුරුම් ක්‍රමවේද කෙරෙහි කාර්ය මණ්ඩලය හා සිසුන් ප්‍රමාණවත් පරිදි දැනුවත් කර ඒ සම්බන්ධයෙන් දිරි ගැන්වීම් කර නොතිබුණු අතර ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදුවන සෘජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය බලපෑම අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහිද ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ඉඩම හා ගොඩනැගිලි සංකීර්ණයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හා ඇතැම් දේපළ පිරියත හා උපකරණ නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතීම. |

| | |
|---|---|
| (ආ) ගිණුම්කරණය | නිශ්චිතව හඳුනාගෙන තිබුණු වියදම් උපචිත වියදම් වශයෙන් ගිණුම්ගත නොකර ගිණුම්වල උපචිත වියදම් සඳහා වෙන් කර තිබීම. |
| (ඇ) බැංකු ගිණුම් පවත්වා ගෙන යාම | අනුමැතියකින් තොරව ජංගම ගිණුම් ආරම්භ කිරීම හා රේඛනය නොකල චෙක්පත් භාවිතා කිරීම. |
| (ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණය | පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) අයවැය ලේඛනමය පාලනය | නිශ්චිත පුරෝකථනයකින් තොරව අයවැය ලේඛනය පිළියෙල කිරීම. |